**කාත්තන්කුඩි නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------

නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරිය) 177(2) වගන්තිය අනුව 2015 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය ඊළඟ මාර්තු මාසයේ 01 දිනට පෙර රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,092,846 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,128,498 ක් විය.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 වරිපනම් බදු

----------------

2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවැති රු.6,358,166 ක් වටිනා වරිපනම් බදු 2017 ජුනි 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

"පිළිසරු" මූලාධාර වැඩසටහන යටතේ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණය කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. 8,394,228 ක පිරිවැයක් දරා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද සභාව විසින් එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය සභා බල ප්‍රදේශයේ පිහිටි ගං ඉවුරක බැහැර කරමින් තිබුණි. මේ නිසා පරිසරයට අධික වශයෙන් හානි සිදු වී තිබුණි. එසේ වුවත්, සභාව විසින් මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | ඇතුළත් විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.3 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවිය යුතු රු.6,642,880 ක මුදල ගෙවීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.1(ඇ) | ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දී තිබූ රු.2,399,352 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.1(ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු රු.35,376 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

### 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට පියවර ගැනීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | i ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම.<br>ii භාවිතා නොකර නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතා කිරීමට පියවර ගැනීම. |
| (ඇ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |